# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් பெக்ஸ் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (பெக்ஸ்) 2868450

මැතිවරණ මහලේකම්කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය : Pre/09/24/2010
இல :
ඔබේ අංකය :
உமது இல :
දිනය :
திகதி : 2009.12.10

<u>TR-11-07</u>

**සියළුම තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>ජනාධිපතිවරණ ඡන්ද විමසීම - 2010.</u>**

**<u>ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවා ගනු ලබන වාහන</u>**

**<u>හදිසි අනතුරු වලට භාජනය වීම.</u>**

උක්ත ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතු ඇතුළුව ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදවාගනු ලබන වාහනයක් හදිසි අනතුරකට භාජනය වුයේ නම්, සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු සියළුම ක්‍රියාමාර්ග කිසිදු වෙනසකින් තොරව අනුගමනය කළ යුතුවේ. මෙම ක්‍රියා මාර්ගයන්ට පහත සඳහන් පියවරද ඇතුළත් විය යුතුය.

I. අනතුර පිළිබඳව නොපමාව පොලිසියට දැන්වීම.
II. වාහනය පූර්ණ රක්ෂණය කර ඇත්නම්, අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.
III. අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම.
IV. අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයන් වී නම් ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම.
V. රථයට සිදුවී ඇති හානි පිළිබඳව මාණ්ඩලික නිලධාරියෙකු ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම.

02. අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අප දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂවලින් දරණු ලබන්නේ නම් ඉහත 1 ඡේදයේ සඳහන් වාර්තාවන්ට අමතරව පහත සඳහන් විස්තරද අප වෙත සැපයිය යුතුය.

I. රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්
II. දිස්ත්‍රික් මෝටර්රථ පරීක්ෂකගේ වාර්තාවක් සමඟ දළ ඇස්තමේන්තුවක්

03. මෙම දෙපාර්තමේන්තුව විසින් වාහනය අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන ආයතනයට කෙලින්ම මුදල් ගෙවීමක් සිදු නොකරන අතර, දරණ ලද වියදම් ප්‍රතිපූරණය කිරීමක් හෝ අවශ්‍ය මුදල් වාහනය අයත් දෙපාර්තමේන්තුවට ලබාදීම පමණක් කරනු ඇත.

**දයානන්ද දිසානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** : 01. ගණකාධිකාරී (මුදල්)
02. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: PR.E/0924/2010
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2009.12.29

<u>TR/11-08</u>

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් වෙත,**

**<u>ජනාධිපතිවරණ ජන්ද විමසීම - 2010.01.26</u>**

**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, සහකාර තේරීම් භාර නිලධාරීන්</u>**

**<u>ජන්ද විමසීමේ රාජකාරි සඳහා නිල වාහන (Assigned Vehicles) /</u>**

**<u>සංචිත වාහන (Pool Vehicles) රැගෙන යාම</u>**

උක්ත ජන්ද විමසීමේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි හෝ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්වීම් ලබා ඇති නිලධාරීන් තමාට හිමි නිල වාහනයක් ඇත්තේ නම් එම නිල වාහනය තම කාර්යාලය / නිවසේ සිට අදාල දිස්ත්‍රික්කයට/ තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාම සඳහා පාවිච්චි කිරීම අනුමත කරමි. මේ අනුව තම නිල වාහනය රැගෙන යාමට බලාපොරොත්තු වන නිලධාරීන් ඒ බව කල් ඇතිව අදාල දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීට දැනුම් දී ඔහුගේ අනුමැතිය ලබාගත යුතුය.

02. මෙහිදී නිලධාරියා විසින් **තම නිල වාහනයට අදාල දිස්ත්‍රික්කයට/ තේරීම්භාර නිලධාරී කාර්යාලයට යාමට ප්‍රමාණවත් ඉන්ධන ප්‍රමාණය පමණක් තම කාර්යාලයෙන් ලබාගත යුතුය. එම ඉන්ධන සඳහා වැයවූ මුදල පමණක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ කාර්යාලය වෙත ප්‍රතිපූරණය කරනු ලැබේ. නිල වාහනය යොදාගත් නිලධාරියාගේ නමට ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කිරීමක් කරනු නොලැබේ.** මේ සඳහා යොදාගත යුතු AV 1 ආකෘතිය මේ සමඟ අමුණා ඇත.

03. නිල වාහනයක් නොමැති එවැනි නිලධාරීන් තම සේවා ස්ථානයෙන් රජයේ වාහනයක් රැගෙන යාමට බලාපොරොත්තු වන්නේ නම් ඒ බව කල් ඇතිව තේරීම් භාර නිලධාරී වෙත දැනුම් දිය යුතුය. **එම වාහනය සඳහා තම කාර්යාලයෙන් අදාල දිස්ත්‍රික්කයට/තෙරීම්භාර නිලධාරී කාර්යාලයට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාගත යුතු අතර එම ඉන්ධන සඳහා වැයවූ මුදල් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත. ඔහු ඡන්ද විමසීමට අදාළ රාජකාරීන්හි නිරත වන්නේ නම් ඒ සඳහාද ඡන්ද විමසීම නිමකර ආපසු තම කාර්යාලයට / නිවසට පැමිණීම සඳහාද අවශ්‍ය ඉන්ධන ද අදාල තේරීම් භාර නිලධාරී විසින් ලබාදෙනු ඇත.** සංචිත වාහන (Pool Vehicles) සඳහා නිකුත් කළ ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා PV 1 ආකෘතිය යොදා ගත යුතුය. ඡන්ද විමසීම් රාජකාරීන්හි නිරත වු නිලධාරීන්ට ගෙවන ලද දීමනා ප්‍රතිපූරණය කිරීමට ඉදිරිපත් කරන ආකෘති වල ඉන්ධන වියදම් ප්‍රතිපූරණය ඉල්ලීම් ඇතුලත් නොකළ යුතුය.

04. නිල වාහනය හෝ සංචිත වාහන රැගෙන යාමේදී රජයේ රියදුරෙකු යොදවා ගත යුතු අතර ඒ සඳහා වු ගෙවීම් උපදෙස් මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛය මගින් ලබාදෙනු ඇත.

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්.

**පිටපත්** :- 1. අතිරේක මැතිවරණ කොමසාරිස් (I) - දැනගැනීම සඳහා කාරුණිකව

2. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - දැනගැනීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා කාරුණිකව

3. විගණකාධිපති

4. ගණකාධිකාරී (මුදල්)
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) } - දැනගැනීම සඳහා.

# මැතිවරණ දෙපාර්තමේන්තුව

## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107

මගේ අංකය: PR.E/0924/2010
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2009.12.29

**<u>TR-11-09</u>**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් හා**

**නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් වෙත**

**<u>ජනාධිපතිවරණ ඡන්ද විමසීම - 2010.01.26</u>**

**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් සතු පෞද්ගලික වාහන මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනීම.</u>**

ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වශයෙන් හෝ කළාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන් වශයෙන් හෝ කටයුතු කිරීම සඳහා තෝරා ගන්නා ලද නිලධාරීන්ට පෞද්ගලික වාහනයක් ඇත්තේ නම් එය ඡන්ද විමසීමේදී තම රාජකාරී සඳහා යොදා ගැනීමට ඉඩදීමෙන් මැතිවරණ රාජකාරී සඳහා තෝරා ගන්නා නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමේදී දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීට පහසුවක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

02. එබැවින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී /කළාප භාර සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත් කිරීමට තෝරාගෙන ඇති නිලධාරීන් තම පෞද්ගලික වාහනය මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනීමට අවසර ඉල්ලන්නේ නම් පහත සඳහන් කොන්දේසි යටතේ අවසර දීම හා **ආයතන සංග්‍රහයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් යටතේ** එම රාජකාරීගමන් සඳහා සැතැපුම් කුලිය ගෙවීම අනුමත කරමි.

(I) කළාප භාර සහකාර තේරීම් භාර නිලධාරී විසින් යොදවා ගැනීමට අපේක්ෂිත වාහනය දිස්ත්‍රික්කයේ මාර්ග වල ස්වභාවය අනුව ධාවනය කිරීමට සුදුසු තත්වයෙන් තිබිය යුතුය.

(II) මෙම වාහනය අතරමගදී අක්‍රියවීමක් සිදුවීමට අවකාශයක් නොමැති මනා ධාවන තත්වයකින් යුත් විශ්වාසවන්ත එකක් විය යුතුය.

(III) තමනට නියමිත රාජකාරී අවසන් කිරීමට පෙරාතුව වාහනයේ දෝෂයක් ඇතිවීම නිසා අදාල රාජකාරී සඳහා වෙනත් වාහනයක් සැපයීමට සිදු වුවහොත් මුල් වාහනය වෙනුවෙන් කිසිදු ගෙවීමක් ඉල්ලා නොසිටීමට නිලධාරියා එකඟ විය යුතුය.

(IV) අදාළ වාහනයේ හිමිකාරීත්වය නිලධාරියාගේ හෝ කලත්‍රයාගේ විය යුතුය (එය තහවුරු කිරීම සඳහා VI ආකෘතිය පුරවා බාරදෙනු ලබන අවස්ථාවේදී රථයේ ආදායම් බලපත්‍රයේ ජායා පිටපතක් ඊට අමුණා තිබිය යුතුය).

03. මේ අනුව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී / සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්කරනු ලැබූ නිලධාරියෙකු තම පෞද්ගලික වාහනය/ ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදා ගැනීමට **අදහස් කරන්නේ නම් ඒ සඳහා ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව ඒ බව අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීට හෝ නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දී පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

04. එසේ තම පෞද්ගලික වාහනය මැතිවරණ රාජකාරී සඳහා රැගෙන යන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන් විසින් අදාල දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත වාර්තා කළ වහාම සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) වෙත ලබාදී ඇති (V1) "ඡන්ද විමසීම් රාජකාරී සඳහා නිලධාරීන් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන පිළිබඳ තොරතුරු" පත්‍රිකාව සම්පූර්ණ කර භාරදිය යුතුය. එහි ආදර්ශ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

05. ඡන්ද විමසීම් කටයුතු අවසන් වී නිලධාරියා ආපසු පිටත්වීමට ප්‍රථම සහකාර තේරීම් භාර නිලධාරී (ප්‍රවාහන) විසින් එම පත්‍රිකාවෙහි 'ආ' කොටස සම්පූර්ණ කර ඔහුට භාරදිය යුතුය. නිලධාරියා ගමන් වියදම් ඉල්ලුම් කිරීමේදී එම සහතිකය වව්චරයට අමුණා ඉදිරිපත් කළ යුතු අතර **මෙම සහතිකය නොමැති කිසිදු ගමන් වියදම් වව්චරයකට ගෙවීම් නොකිරීමට ගෙවීම් බලධාරීන් වග බලා ගත යුතුය.**

**දයානන්ද දිශානායක,**
මැතිවරණ කොමසාරිස්

**පිටපත්** :- 1. අතිරේක මැතිවරණ කොමසාරිස් (I) - දැනගැනීම සඳහා.
2. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - ඔබ විසින් යොදවනු ලබන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
3. විගණකාධිපති
4. ගණකාධිකාරී (මුදල්)
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) } - දැනගැනීම සඳහා.

# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர்          ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය . 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: PRE/09/24/2010
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2009.12.18

TR/11/10

**සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්/**

**නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත.**

**2010- ජනාධිපතිවරණය**

**ඡන්දපොළ රාජකාරී සඳහා ශ්‍රී ලංකා ගමනාගමන**

**මණ්ඩලයේ බස්රථ ලබා ගැනීම**

2010.01.26 දින පවත්වනු ලබන උක්ත ඡන්ද විමසීමේදී ඡන්ද පෙට්ටි, ඡන්ද පොළ නිලධාරීන් හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථද යොදා ගැනීම අනුමත කරමි.

02. ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය ඩිපෝ අධිකාරී සමග සාකච්ඡා කර අවශ්‍ය වැඩ පිළිවෙළ සකස්කර ගැනීමට කරුණාකර කටයුතු කරන්න. මෙම බස්රථ පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ලබා දීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ එකඟතාවය ලැබී ඇත.

| | පැය 12 හෝ ඊට අඩු කාලයකට මුදා හරින බස්රථ සඳහා | පැය 12 ට වැඩි කාලයකට මුදා හරින බස්රථ සඳහා |
|---|---|---|
| ආසන 42 හෝ ඊට වැඩි | රු 8000 | රු 9000 |
| ආසන 32 හෝ ඊට වැඩි | රු 6000 | රු 7000 |
| සේවක දීමනා | රු 350 | රු 700 |
| උපරිම කි.මී. ගණන | රු 100 | රු 125 |
| උපරිම කි.මී. ගණන ඉක්මවූ විට කි.මීටරයට | රු 60 | රු 60 |
| පැය 12 වැඩි කාලයක් ඉකුත් වූ විට ගාස්තුව පැයකට | රු 400 | |

03. ඡන්ද විමසීම නිම වීමෙන් අනතුරුව මෙම ගාස්තු ප්‍රමාණයන් යටතේ ඔබ විසින් ලබා ගත් බස් රථ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

**දයානන්ද දිශානායක**
**මැතිවරණ කොමසාරිස්**

**පිටපත් :-**

1. **මධ්‍යම ගමනාගමන මණ්ඩලය - නාරාහේන්පිට**
   ඔබේ අංක ශ්‍රීලංගම/ප්‍රමේඅ/මැ.රා.V/128/2009 හා 2009.12.14 දිනැති ලිපියෙන් දැනුම් දෙන ලද පරිදි අදාළ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්/ නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම අනුව අවශ්‍ය බස්රථ ලබා දීම සඳහා ඔබගේ ප්‍රාදේශීය ඩිපෝ අධිකාරීවරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම සඳහා
2. අතිරේක මැතිවරණ කොමසාරිස් -1 - දැන ගැනීම සඳහා
3. විගණකාධිපති - දැන ගැනීම සඳහා
4. ගණකාධිකාරී (මුදල්) - අවශ්‍ය කටයුතු සඳහා
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැන ගැනීම සඳහා